සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

නම : ............................................... **චිත්‍ර කලාව** කාලය : පැය 02 යි.

සැලකිය යුතුයි:-

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

## I කොටස

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.



(1) ඉහත රූපයෙන් දැක්වෙන්නේ ........................................................................................................ කර්මාන්තයේ භාණ්ඩ සකස් කරන එක් ක්‍රමයකි.

(2) එම ක්‍රමය ........................................................................................................ යනුවෙන් හඳුන්වන අතර අනෙක් ක්‍රමය වාත්තු කිරීමේ ක්‍රමය ලෙස හඳුන්වයි.

(3) රූපයේ දැක්වෙන ක්‍රම ශිල්පය උපයෝගී කරගෙන සාදන භාණ්ඩයක් ලෙස ........................................................................ නම් කළ හැක.

(4) මෙම කලා කර්මාන්තය ශ්‍රී ලාංකිකයන් අතර වඩාත් ජනප්‍රියත්වයට පත් වී ඇත්තේ .................................................................. වන සියවසේ දීය.

(5) ඉහත රූපයේ දැක්වෙන භාණ්ඩ සෑදීමේ ක්‍රම ශිල්පයට අනුව භාණ්ඩ ඔප දැමීම සඳහා .......................................... .................................................................. වැනි උපකරණ යොදා ගනී.

**I ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(6) රූකඩ නිර්මාණ සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වන අංගයක් නොවන්නේ,

(1) පසුබිම් සංගීතය (2) ගීත ගායනය (3) දෙබස් කථනය (4) සංස්කරණය

(7) සාම්ප්‍රදායික මෝස්තරවල දී වාටියක් සැරසිලි කිරීම සඳහා බහුල වශයෙන් මෙම සැරසිල්ල යොදාගෙන ඇත.

(1) පිච්ච මල (2) පලාපෙති (3) සපුමල (4) සීන මල

(8) ශ්‍රී ලංකාවේ බෞද්ධ චෛත්‍යවලට අයත් අංගයක් වන්නේ,

(1) මිනාර් (2) පේසාවළලු (3) අල්තාරය (4) ගෝපුරම්

(9) කාටුන් නිර්මාණවල දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) වැඩිහිටියන් අතර ඉතා ජනප්‍රියය.

(2) ළමයාගේ මනස අවුල් කරයි.

(3) ළමා මනසට උචිත ආකර්ශණීය හැඩතල හා වර්ණ රටා භාවිතා කරයි.


(4) සරළ හැඩතල යොදා ගනියි.

(10) දෛනිකව පවත්වන ''තෙමින්තිය'' පූජාවන්වල බිඳී ගිය බලය තවත් ශක්තිමත් කිරීම සඳහාත් වසර 1කට වතාවත් පවත්වන ශාන්ති කර්මය වන්නේ,

(1) දීපවාලි (2) තෛපොංගල් (3) කුම්බාබිෂේකම් (4) පහන් මඩුව


**I ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති සාම්ප්‍රදායික සැරසිලි මෝස්තරවල ඇති සත්ත්ව රූප නම් කරන්න.**








11. ..................................................  12. ..................................................  13. ..................................................





14. ..................................................  15. ..................................................

**I ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් අතරින් ඇල්ටමයිරා ගුහා චිත්‍ර ඇති රට කුමක් ද? ..................................................

17. කාන්තා දේව රූප සඳහා බහුලව භාවිතා කෙරෙන තැන්පත් බව සංකේතවත් කරන මුද්‍රාව කුමක් ද?
..........................................................................


18. බුදු පිළිමවල වම් පාදය මත දකුණු පාදය සිටින සේ වාඩි වී සිටින ආකාරය හඳුන්වන නම කුමක් ද?
..........................................................................

19. පාරම්පරික කලා කර්මාන්තයක් වන මැටි කර්මාන්තයේ දී සාදනු ලබන ඉදිකිරීම් ආශ්‍රිත භාණ්ඩයක් නම් කරන්න.
...........................................................................................................

20. රුවන්වැලි සෑයේ ඇත් පවුර කරවන ලද්දේ කුමන රජතුමා විසින් ද? ...................................................................................

**I ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති රූප සටහන්වලට ගැළපෙන රූප සටහන A, B, C, D, E රූපසටහන් තෝරා ඒට අදාළ අංකය ඉදිරියේ ඇති හිස්තැනෙහි යොදන්න.**

21.  .......................................... (A) 

22.  .......................................... (B) 

23.  .......................................... (C) 

24.  .......................................... (D) 

25.  .......................................... (E) 

**l ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් (3) ලකුණ ද වැරදිනම් (7) ලකුණ ද යොදන්න.**

26. ප්‍රථම කොහොඹාකංකාරි ශාන්ති කර්මය සේරමාන් රජුගේ හිසේ හටගත් රෝගයක් සුව කිරීම අරමුණු කරගෙන පවත්වා ඇත. (          )

27. ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන්ගේ රූව සහ බිම වැතිරී සිටින මිනිසෙකුගේ රූව සහිත චිත්‍රය ලැස්කෝ ගුහාවේ දැකිය හැකිය. (          )

28. ගඩොලින් ඉදිකර ඇති ජේතවන දාගැබ, එම වර්ගයේ අවශේෂ ස්මාරක අතර ලෝකයේ දැනට නටබුන්ව පවත්නා උසම පූජනීය ගොඩනැගිල්ල වේ. (          )

29. පන් හා නියඳ කර්මාන්තයේ දී වෙනිවැල් ගැට හෝ අමුකහ භාවිතයෙන් රතු පාට සාදාගෙන ඇත. (          )

30. සිංහල සැරසිලි කලාවේ මූලික ආභාසයක් වන වක දෙක හා ලියපත මෝස්තරය ආභාෂයෙන් කතිරමල නිර්මාණය කර ඇත. (          )

## II කොටස

**l සැලකිය යුතුයි.**

**l පහත සඳහන් මාතෘකාවලින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගෙන එක් චිත්‍රයක් පමණක් ඇඳ වර්ණ කරන්න.**

**l චිත්‍රයේ පසු පිටෙහි ඔබේ නම /විභාග අංකය/පංතිය සහ තෝරාගත් මාතෘකාව හෝ අංකය සටහන් කරන්න.**

01. ආගමික උත්සවයක බැතිබර මොහොතක්

02. වන සතුන් නැරඹීමට වැව් ඉවුරක් අසලට ගිය දා

03. බස් නැවතුම් පොලක හෝ දුම්රිය නැවතුම් පොළක හෝ කලබලකාරී අවස්ථාවක්

04. අඟල් 8 5 8 ප්‍රමාණයේ කුෂන් කවරයක් සඳහා උචිත සැරසිලි යොදා නිල් පැහැයේ ප්‍රභේදවලින් වර්ණ කරන්න.

05. ළමා මනසට උචිත වර්ණ හා හැඩතල යොදා ඇඳ ඇතිරිල්ලකට සුදුසු මෝස්තරයක් අඳින්න.

06. මැටි බඳුනක් සඳහා සුදුසු මෝස්තර යොදා උචිත වර්ණ යොදන්න. (බඳුන පමණක් අඳින්න)

07. ළමා කතාන්දරයකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් අඳින්න.

(ලකුණු 70යි)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**Answer**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

## Third Term Test - Grade 8 - 2019

### චිත්‍ර කලාව - පිළිතුරු පත්‍රය

### I කොටස

(1) පිත්තල

(2) තලන වැඩ

(3) බන්දේසි/හෙප්පු/පහන් ආවරණ/යතුරු මූණත් තහඩු/තිරුවාසි/ආභරණ පෙට්ටි පියන් ආදී පැතලි ආකාරයේ භාණ්ඩයක් සඳහා ලකුණක් දෙන්න.

(4) 18 වන සියවසේ

(5) පීර/නියන්/උල්කටු වැනි උපකරණ වලින් එකකට ලකුණක් දෙන්න.

(6) සංස්කරණය (4)

(7) පලාපෙති (2)

(8) පේසා වළලු (2)

(9) ළමා මනසට උචිත ආකර්ශණීය හැඩතල හා වර්ණ රටා භාවිතා කරයි. (3)

(10) කුම්බාබිෂේකම් (3)

(11) යාලි

(12) ගජසිංහ

(13) සරපෙන්දියා

(14) ගවයා

(15) හේරුණ්ඩ පක්ෂියා

(16) ස්පාඤ්ඤයේ (17) ලෝලහස්ත මුද්‍රාව (18) වීරාසන ක්‍රමය

(19) උළු/පෙති උළු/කොත්/පිහිළි/නළ/ගඩොල් (එකකට ලකුණක් දෙන්න)

(20) සද්ධාතිස්ස රජතුමා (21) C (22) D (23) A

(24) E (25) B (26) 3 (27) 3

(28) 3 (29) 7 (30) 7

(එකකට ලකුණු එක බැගින් මුළු ලකුණු තිහයි)

| | | |
|---|---|---|
| I පත්‍රය 30 5 1 | = | 30 |
| II පත්‍රය | = | 70 |
| එකතුව | = | 100 |